*සැ. යු.* — 2015.05.29 දින පළ වූ අංක 1,917 දරන ගැසට් පත්‍රයේ II කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,918 - 2015 ජුනි මස 05 වැනි සිකුරාදා - 2015.06.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 870 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුනි මස 26 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

869- B 80954— 5,302 (2015/05)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාතේ පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

**(සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යය)**

වයඹ පළාත් සභා පාසල් වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා ගුරු සේවා ව්‍යවස්ථාවේ ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පාදක ක්‍රමය අනුව බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර පුරප්පාඩු පවතින පාසල් සහිත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා විෂය ලේඛනය, අයදුම් කිරීමේ ක්‍රමය සහ ගුරු තනතුරු සඳහා විෂයය අනුව උපාධි සුදුසුකම් ලේඛනය www.psc.nw.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය. තමන් අයදුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුක්‍රමික අංකය හා විෂයය සහ මාධ්‍යයේ සංකේත අංක මනාප අනුපිළිවෙලින් අයදුම්පතේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

02. පුරප්පාඩු සංඛ්‍යාව - 424

03. *වැටුප් ක්‍රමය*.- රා.ප.ච. 6/2006 (xii) හි උපලේඛන II හි විධිවිධාන අනුව ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළ ජී. ඊ. -1-2006 වැටුප් බණ්ඩයේ රු. 13,410-145 x 6-180 x 7-215 x 2-රු.15,970 මාසික ඒකාබද්ධ වැටුප් ක්‍රමය යටතේ වැටුප් ගෙවනු ලබන අතර වැඩ භාරගත් දිනට රු. 15,755/- ක මාසික වැටුප් පියවරෙහි තබා වැටුප් ගෙවනු ඇත. මෙම වැටුප් ක්‍රමය රජය මගින් වරින් වර කරනු ලබන සංශෝධනවලට යටත් වේ.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*.-

4.1 *අධ්‍යාපන සුදුසුකම් :*

(i) ගුරු පත්වීම්වලට අදාලව පිළිගත් සුවිශේෂී කරන ලද විෂය ක්ෂේත්‍ර වලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ උපාධියක් ලත් පුද්ගලයෙකු විය යුතු යි. ඉහත සඳහන් කර ඇති පුරප්පාඩු විෂයයන් ට අදාළ උපාධියක් ලබා තිබිය යුතු යි. උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂය/විෂයයන් අනුව අදාළ ගුරු පුරප්පාඩු සඳහා පමණක් ඉල්ලුම් කළ යුතු ය. උපාධිය වලංගු දිනය 2015.07.06 දිනට පෙර විය යුතු යි.

සහ

(ii) අධ්‍යාපන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතු යි.

4.2 *කායික හා මානසික යෝග්‍යතාවය*.- සෑම අපේක්ෂකයෙකුම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

4.3 *වයස*.- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස් සීමාව අවුරුදු 18 වේ. උපරිම වයස් සීමාව අවුරුදු 40 වේ.

4.4 *වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු/අයදුම්කාරිය පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(ii) තරග විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් වයඹ පළාත් සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කළ සහතිකය මගින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතු ය.)

(iii) විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතු ය.

05. *සේවා කොන්දේසි*.-

(i) මුලින්ම පත් කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පාසල් වල අවම වශයෙන් වසර 10ක් සේවය කළ යුතු යි.

(ii) රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(iii) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(iv) මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වනු ඇත.

(v) උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව සිදු කරනු ඇත.

06.

06.1 *බඳවා ගැනීමේ ක්‍රමය*.- සේවයට බඳවා ගැනීම ලිඛිත විභාගය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදු කරනු ලැබේ.

06.2 *ලිඛිත තරග විභාගය*.- මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

*විභාග පරිපාටිය.-*

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.

(ii) සෑම අපේක්ෂකයෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතු ය.

(iii) අපේක්ෂකයෙකුට ස්වකීය අයැදුම්පතේ දැක්වෙන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02) ටම පෙනී සිටිය යුතු ය.

(v) වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

*විෂය නිර්දේශය :-*

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොටගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතු ය.

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

ගුරු ක්ෂේත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

6.3 *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* .- ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීමට සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

6.4 ප්‍රායෝගික පරීක්ෂණය.- ගුරු වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම සඳහා පවත්වනු ලැබේ. අයැදුම්කරු විසින් හඳුනාගත් මාතෘකාවක් යටතේ විනාඩි පහ (5) කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් සිදු කළ යුතු වේ. මෙහි දී ලකුණු 25ක් ලබාදෙනු ලැබේ. පරිගණක මාධ්‍යයෙන් (Power point presentation) කෙරෙන ඉදිරිපත් කිරීම්වලට ලකුණු දෙනු නොලැබේ.

| *අනු. අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිෂ්ටවීම | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය | 05 | 02 |
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය | 25 | 10 |

*නිර්ණායකයන්හි අරමුණ :*

(i) අරමුණ හා ප්‍රවිෂ්ට වීම :
සාර්ථකව පාඩමෙහි අරමුණු පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිෂ්ට වීමේ හැකියාව ඇගයීම

(ii) *පෞරුෂය හා හඬ පාලනය :*

ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම

(iii) *සන්නිවේදනයේ පැහැදිලි බව :*

ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම

(iv) *කාල කළමනාකරණය :*

ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම

(v) *ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය :*

අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

*තෝරා ගැනීමේ ක්‍රමය :-*

(i) ලිඛිත විභාගයේ විෂයයන් දෙකම සමත් වන අයැදුම්කරුවන් අතරින් ඔවුන්ගේ ලකුණුවල එකතුව මත කුසලතා අනුපිළිවෙල අනුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පුරප්පාඩු සංඛ්‍යා අනුව බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර ඉන් සුදුසුකම් සපුරා ඇති අයැදුම්කරුවන් පමණක් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ඉල්ලුම් කළ අය අතරින් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) ලිඛිත පරීක්ෂණයෙන් සමත් හා ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයැදුම්කරුවන් ඔවුන් ලබාගත් ලකුණුවල එකතුව අනුව ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල තීරණය කරනු ලැබේ. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පාදකව අදාළ පාසල්වලට ස්ථානගත කෙරේ.

(iii) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවන අයැදුම්කරුවන් අතරින් යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට සුදුසුකම් ලැබූවන් නොමැති අවස්ථාවක දී ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් නොකළ එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ඉල්ලුම් කළ ලිඛිත විභාගය සමත් අය අතරින් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ සිට ඉහත ක්‍රියාවලිය අනුගමනය කර තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(iv) යම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට කිසිදු අයැදුම්කරුවකු ඉල්ලුම් කර නොමැති අවස්ථාවක දී හෝ කිසිදු අයැදුම්කරුවකු ලිඛිත විභාගය සමත්ව නොමැති අවස්ථාවක දී හෝ බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව අනුව ලිඛිත විභාගය සමත් වූ අයැදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී හෝ එබඳු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා බඳවාගනු ලබනුයේ වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා අයැදුම්කර ලිඛිත විභාගය සහ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වූ අය අතරින් කැමැත්ත විමසා ඔවුන් ලබාගෙන ඇති කුසලතා අනුපිළිවෙල මත තෝරාගනු ලැබීමෙනි.

07. *විභාග මධ්‍යස්ථානය.*- මෙම තරග විභාගය පහත දැක්වෙන නගර වල දී පවත්වනු ලැබේ.

| *නගරය* | *අංකය* |
|---|---|
| කුරුණෑගල | 1 |
| පුත්තලම | 2 |

08. *විභාග ගාස්තු.*- විභාග ගාස්තු වශයෙන් රුපියල් 500ක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ව. ප. ස. මු. 02 ආකෘතියෙන් ලබා ගත් රිසිට්පත තම අයැදුම්පතෙහි නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතු ය. මෙම ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හා මුදල් ඇණවුම් හෝ මුදල්, භාරගනු නොලැබේ. කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බවද සැලකිය යුතු ය.

09. *අයැදුම් කළ යුතු පිළිවෙල :*

9.1 අයැදුම්පත්‍රය - ඒ 4 (සෙ. මී. 21x29) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්

(i) අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවැනි පිටුවට ද,

(ii) අංක 04 සිට ඉදිරියට වන ඡේදයක් අනෙන් පිටු වලට ද, ඇතුළත් වන සේ අයැදුම්පත් පිළියෙල කරගත යුතු ය.

(iii) ආදර්ශ අයැදුම්පතට අනුකූල නොවන අයැදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයැදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයැදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. තව ද සම්පූර්ණ කරනු ලබන අයැදුම්පත් විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයැදුම්පතට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරුවන් විමසා බැලිය යුතු ය. සම්පූර්ණ කරන ලද අයැදුම්පතේ ඡායා පිටපතක් අයැදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(iv) අයැදුම් කරනු ලබන විෂයය කිසිසේත් වෙනස් කරනු නොලබන අතර එක් අයැදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයැදුම්පතක් පමණි.

(v) *අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

අයැදුම්පතෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්චයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු/පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සභා සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කර තිබිය යුතු ය.

(vi) දැනටමත් රාජ්‍ය හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් තම අයැදුම්පත අදාල ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

9.2 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයැදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2015.07.06 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයැදුම්පතක් භාරගනු නොලැබේ :-

ලේකම්,<br>
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
බී දොරටුව,<br>
පළාත් සභා කාර්යාල සංකීර්ණය,<br>
කුරුණෑගල.

අයැදුම්පත බහා ඇති කවරයේ වමත්පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ගුරු සේවයට උපාධිධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015" ලෙස සඳහන් කළ යුතු ය.

9.3 නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත් ඉදිරිපත් කර ඇති මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් 2015.07.06 දිනට පෙර සම්පූර්ණ කරන ලද අයැදුම්කරුවන් සඳහා තරග විභාගයට පෙනී සිටීමට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ. එහෙත් මෙම තරග විභාගය සඳහා පෙනී සිටීමට ඉඩදීම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයැදුම්කරුවන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවා මෙම නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ බඳවා ගැනීම සඳහා වන අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ (www.psc.nw.gov.lk) පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල යන ලිපිනයට පහත විස්තර සහිතව දැන්විය යුතු ය :-

(i) විභාගයේ නම ;<br>
(ii) අයැදුම්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය ;<br>
(iii) අයැදුම්පත යොමුකල ලිපිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය හා දිනය ;

10. *අනන්‍යතාවය.*- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකු විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කළ යුතු ය. මේ සඳහා

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල ජාතික හැඳුනුම්පත ; හෝ
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ පිළිගැනේ.

11. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්.*- ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයැදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු/ඇය පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පුලුවන. අපේක්ෂකයෙකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සළසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම/තීරණය කිරීමේ අයිතිය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2015 මැයි මස 21 වැනි දින,
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා : [ ]

***වයඹ පළාත් පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියට උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015 (සිංහල/දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යය)***

විභාගයට පෙනී සිටින නගරය : [ ] නගර අංකය : [ ]

(නිවේදනයේ 07 ඡේදය අනුව සම්පූර්ණ කරන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි -4
(අදාළ අංකය කොටුව තුල ලියන්න)

| මනාපය | ඉල්ලුම් කරන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුක්‍රමික අංකය | ඉල්ලුම් කරන විෂය සහ මාධ්‍යය සංකේත අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |

(නිවේදනයේ 01 ඡේද අනුව සම්පූර්ණ කරන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරුවලින් දැක්වෙන නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0 2.1 වර්තමාන ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

2.2 වර්තමාන ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

2.4 දුරකථන අංකය :————.

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.2 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.3 2015.07.06 දිනට වයස :

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

3.4 ස්ත්‍රී/පුරුෂ භාවය - පුරුෂ - 0 [ ]
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1 [ ]
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 4.1 ලබා ඇති උපාධිය පිළිබඳ විස්තර :————.
4.1.1 උපාධිය :————.
4.1.2 උපාධිය ලබා ගත් විශ්වවිද්‍යාලය :————.
4.1.3 උපාධියට හදාරන ලද ප්‍රධාන විෂයය/විෂයයන් :————.
4.1.4 උපාධිය වලංගු වන දිනය :————.
4.1.5 උපාධිය හදාරන ලද මාධ්‍යය :————.

4.2 අ.පො.ස. (සා. පෙළ) :

| | *සමත් වූ වර්ෂය* | *විභාග අංකය* |
|---|---|---|
| පළමු වර | | |
| දෙවන වර | | |

| | *විෂයය* | *පළමු වර සාමාර්ථය* | *දෙවැනි වර සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |
| 08 | | | |
| 09 | | | |
| 10 | | | |

5.0 *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර.-*

5.1 විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
5.2 ලදුපත් අංකය හා දිනය :————.
5.3 ගෙවූ මුදල :————.

ලදුපතේ ඡායා පිටපතක් ඔබ වෙත තබා ගන්න.
ලදුපත නොගැළවෙනසේ මෙහි අලවන්න.

6.0 *අයැදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව ද මම දනිමි. මා මේ තනතුරට තෝරා ගැනීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව මම දනිමි.

*(ඇ)* විභාග ගාස්තු සඳහා වන නියමිත මුදල් ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවා ඇති බව සහතික කරමි. තවද විභාගය සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින්/වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීති වලට මම එකඟ වෙමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයැදුම්කරුගේ අත්සන.

දිනය :————.

7.0 *අයැදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයැදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන............................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී..................................... වැනි දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.
සහතික කරන නිලධාරියා ගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

8.0 අයැදුම්කරු රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවකයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

......................................................................... මයා/මිය/මෙනවිය ගේ අයැදුම්පත ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිළධාරියා.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

06-196

---

## වයඹ පළාත් දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

වයඹ පළාත් දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලංකා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් ක්‍රමය :*

*(අ)* ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණිය
14,425 -10 x 145 - 11 x 170 - 6 x 240 - 14 x 320 - 23,665
රා.ප.ච. 6/2006 (iv) - MT1/2006A අනුව

*(ආ)* අභ්‍යාසලාභී තනතුර
මාසිකව රු. 12,000

*(අ)* ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණිය

සටහන i

මෙම වැටුප් ක්‍රමය දක්වා ඇත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (iv) අනුවය. මෙම වැටුප් ක්‍රමය රජය මගින් වරින් වර කරනු ලබන සංශෝධන වලට යටත් වේ. මෙම තනතුරට බඳවා ගන්නා නිලධාරීන් මුල් පත්වීමේ සිට වසර 03 ක් ඇතුලත I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

සටහන ii

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව සේවයට බැදී වසර 05 ක් ඇතුලත බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව/භාෂා පිළිබඳ ප්‍රවීනතාවයක් ලබා ගත යුතු ය.

03. *අධ්‍යාපන, වෘත්තීය හා වෙනත් සුදුසුකම් :*

3.1 *(අ) අධ්‍යාපන සුදුසුකම් :*

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී සිංහල/දෙමළ හා ගණිතය විෂයයන් සහ තවත් විෂයයන් 02 කට සම්මාන සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලත්ව විෂයයන් 06 කින් එකවර සමත්ව තිබීම.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(iii) ජාතික ක්‍රීඩා විද්‍යායතනය මගින් පවත්වනු ලබන වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා සමත්ව තිබීම.

*(ආ) වෘත්තීය සුදුසුකම් :*

(i) යම් කිසි ක්‍රීඩා ඉසව්වක ජාතික කණ්ඩායමේ සාමාජිකයෙකුව පිළිගත් ජාත්‍යන්තර තරගයකට සහභාගී වි තිබීම. *හෝ*

(ii) ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලකදී යම් ඉසව්වකින් ජාතික මට්ටමින් 1, 2, 3 ස්ථාන ලබා තිබීම හෝ පළාත් මට්ටමින් 1, 2 ස්ථාන ලබා තිබීම හෝ ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ප්‍රධාන ජාතික විවෘත තරගයක දී 1, 2, 3 ස්ථාන ලබා තිබීම.

*(ඇ) කායික සුදුසුකම් :*

සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර ශාරීරික යෝග්‍යතාවය පිරික්සීම සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව හා ක්‍රීඩා වෛද්‍ය ඒකකය විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. එම පරීක්ෂණය ප්‍රතික්‍රියා වේගය, නම්‍යතාවය, උදරයේ ශක්තිය, දෑත්වල ශක්තිය, උලගිතාවය, හිටි දුර පැනීම හා වේගය හා දරාගැනීම යන අංගයන්ගෙන් සමන්විත වේ.

*(ඈ) වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයැදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) ආගමික හෝ ආගමික නිකායක පැවිදි වරයක් දරන තැනැත්තෙක් නොවිය යුතු ය.
(iv) අයැදුම්කරු/අයැදුම්කාරිය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් වයඹ පළාත තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනයේ නම ඇතුළත් විය යුතු ය.)
(v) දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහු හෝ ඇය අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක් තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.
(vi) අයැදුම්පත් කැඳවන දිනට පෙර ඉහත සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

3.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතු ය. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවාවේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අවුරුදු 40 වේ.

*(ආ) අභ්‍යාසලාභී තනතුර.-* ඉහත තනතුරට බඳවා ගැනීම් කිරීමේදී ප්‍රමාණවත් අයැදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති අවස්ථාවල වෘත්තීය සුදුසුකම් i හි දක්වා ඇති පරිදි ජාත්‍යන්තර තරග සඳහා සහභාගී වූවන්ට ඉහත අධ්‍යාපන සුදුසුකම් යටතේ ii හි සඳහන් අ.පො.ස. (උ. පෙළ) එක් විෂයයක් සමත්වීම හා 3.1 (අ) iii හි සඳහන් සුදුසුකම් සේවයට පත්ව වසර 3 ක් ඇතුළත සම්පූර්ණ කිරීමේ පදනම මත මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකි ය. එසේ තෝරා ගන්නා ලද නිලධාරීන් අභ්‍යාසලාභී තනතුරට පත් කරනු ලබන අතර,

අවුරුදු 03 ක කාලය ඇතුළත අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ යුතු වේ. එම සුදුසුකම සම්පූර්ණ කළ දින සිට ක්‍රීඩා නිලධාරී III පන්තියට පත් කරනු ලැබේ.

අදාල කාලය තුළ නියමිත සුදුසුකම් සම්පූර්ණ කිරීමට නොහැකි වුවහොත් එම අයගේ සේවය අවසන් කිරීමේ බලය පත්වීම් බලධාරියා සතු වේ. එසේම සාධාරණ හේතු සලකා බලා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය මත අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම සඳහා වසරකට නොඅඩු කාලසීමාවකින් අභ්‍යාසලාභී තනතුරෙහි කාලසීමාව දීර්ඝ කිරීමේ බලයද පත්වීම් බලධරයා සතු ය.

04. *සේවා කොන්දේසි :-*

4.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් අදාළ වන පරිදි අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වනු ඇත.

4.3 ආයතන සංග්‍රහයේ 1 වන කාණ්ඩයේ 11 වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවල විධිවිධාන තනතුරට ගැලපෙන පරිදි අදාළ වනු ඇත.

4.4 සෑම නිළධාරියෙක්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන පරිච්ඡේදයේ විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා පනවා ඇති හා කලින් කල පනවනු ලබන අනෙකුත් නීති හා රෙගුලාසි පිළිපැදිය යුතු ය.

4.5 මෙම තනතුර සඳහා බඳවා ගැනීමේ/ උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, මුදල් රෙගුලාසි වලටද පළාත් විනය කාර්ය සංග්‍රහය, පළාත් මුල්‍ය රීති සංග්‍රහයද දෙපාර්තමේන්තු නියෝග වලටද රජය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම නිලධාරීන් බැඳී සිටිය යුතු ය.

4.6 බඳවා ගන්නා ලද නිළධාරීන් ස්ථාන මාරු වීම් වලට යටත් විය යුතු ය. වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ නියම කරනු ලබන කවර හෝ ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති විට වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විවෘත තරග විභාගයක් පවත්වනු ලබන අතර, එම තරග විභාගයේ ප්‍රතිඵල මත 40% කට වඩා වැඩි ලකුණු ලබාගන්නා අයැදුම්කරුවන්ගේ ලකුණු අනුපිළිවෙල අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

ඒ අනුව ව්‍යුහගත පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු ලබාගන්නා ඒකාබද්ධ ලකුණු සංඛ්‍යාව අනුව සකසනු ලබන කුසලතා ලේඛනයට

ඇතුළත් වන්නන්ගෙන් ක්‍රීඩා විද්‍යායතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වන්නන් මෙම තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

පුරප්පාඩු සංඛ්‍යාවට සමාන/අඩු අයැදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත්ව ඇති විට ඔවුන් ක්‍රීඩා විද්‍යායතනයේ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට භාජනය කර ඉන් සමත් වන්නන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කර තනතුරු සඳහා බඳවා ගනු ලැබේ.

*ලිඛිත විභාගය :*

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| 2. භාෂා හැකියාව | 100 | 40% |

*ලිඛිත විභාගයෙහි විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයා සතු සාමාන්‍ය බුද්ධිය, තර්කන හැකියාව, අදහස් ප්‍රකාශනය, සංඛ්‍යාත්මක කුසලතාව හා අවබෝධාත්මක හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |
| 2. භාෂා හැකියාව | අක්ෂර වින්‍යාසය, වියරණ භාවිතය, නිරවුල් හා පැහැදිලි අදහස් ප්‍රකාශනය, භාෂාවේ යෙදුම් පිළිබඳ අවබෝධය, සාරාංශකරණය හා රචනාමය හැකියාව මැන බැලෙන ප්‍රශ්න පත්‍රයකි. |

(අභ්‍යාසලාභී තනතුර සඳහාද ඉහත විභාගය අදාළ වේ.)

*ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :*

| *ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *ලකුණු ලබා දෙන ආකාරය* | | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් | ක්‍රීඩා ඩිප්ලෝමාව (වසර 1 හෝ ඊට වැඩි) | 05 | 10 |
| | සාමාන්‍ය උපාධිය | 07 | |
| | ක්‍රීඩා උපාධිය | 10 | |
| 2. ක්‍රීඩා දක්ෂතාවයන් | බඳවා ගැනීමේ පරිපාටියෙහි 7.2.2.2 වගන්තියෙහි දැක්වෙන ක්‍රීඩා තරග ජයග්‍රහණ සඳහා පමණක් ලකුණු හිමි වේ. | | 70* |
| 3. ක්‍රීඩා තරඟ සඳහා පුහුණු කිරීම, විනිශ්චය, සංවිධානය | බඳවා ගැනීමේ පරිපාටියෙහි 7.2.2.2 වගන්තියෙහි විස්තර වන දිස්ත්‍රික්, පළාත්, (ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ තරග සඳහා පුහුණු කිරීම/විනිශ්චය හෝ සංවිධානය කිරීම සඳහා පමණක් ලකුණු හිමි වේ. (ජාතික හෝ ජාත්‍යන්තර ක්‍රීඩා සංගම් විසින් ප්‍රදානය කළ සහතික/බලපත්‍ර ඉදිරිපත් කළ යුතු ය.)<br>දිස්ත්‍රික්/පළාත් තරග 05<br>ජාතික තරග 07<br>ජාත්‍යන්තර තරග 10 | | 10 |
| ජාත්‍යන්තර භාෂා ප්‍රවීණතාවය | සහතික ඉදිරිපත් කළ යුතු ය. | | 05 |
| පෞරුෂය | | | 05 |

සුදුසුකම් සනාථ කරනු ලැබූ සහතික නැවත පරීක්ෂා කිරීම සහ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමද ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලබයි.

* ක්‍රීඩා දක්ෂතාවයන් සඳහා ලකුණු ලබා දෙන ආකාරය, විස්තරාත්මකව පහත දැක්වේ :-

| ක්‍රීඩා තරග මට්ටම් | 1 | 2 | 3 |
|---|---|---|---|
| පළාත් තරග | 20 | 15 | |
| ජාතික තරග | 45 | 42.5 | 40 |
| දකුණු ආසියාතික තරග | 55 | 52.5 | 50 |
| ආසියාතික ශුරතා, පොදු රාජ්‍ය මණ්ඩලීය, ශුරතා තරගයක 1-2 හෝ 3 වන ස්ථාන ජයග්‍රහණ | | 65 | |
| ආසියාතික, පොදු රාජ්‍ය මණ්ඩලීය, ලෝක ශුරතා, ලෝක කුසලාන, ඔලිම්පික් තරගයක 1-2 හෝ 3 වන ස්ථාන ජයග්‍රහන | | 70 | |

06. *විභාග ගාස්තු.-* විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් විභාග ගාස්තු වශයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැර වන පරිදි තම ස්ථිර පදිංචි කොට්ඨාසයේ හෝ සේවා ස්ථානය පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද ව. ප. ස. මු. 2 ආකෘතියෙන් ලබාගත් රිසිට් පත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතු ය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතන වලට ගෙවා ලබාගත් ලදුපත්, මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැළකිය යුතු ය.

07. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

7.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයැදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ (සෙ. මී. 21x29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයැදුම්පත සකස් කර ගත යුතු ය.

සම්පූර්ණ කර ලද අයදුම්පත් "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, " ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම" - 2015" යනුවෙන් සඳහන් කළ යුතු ය.

7.2 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

7.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිසි ලෙස තොරතුරු ඇතුලත් නොකළ, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූලද යන්න පිළිබඳව විමසා බැලීම අයැදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයැදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයැදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයැදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

08. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2015.07.06 වේ.

09. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

10. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත. පත්වීම් ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑ කමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

11. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති අවස්ථාවක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණයද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා
කොමිෂන් සභාව.

2015 මැයි මස 20 වැනි දින,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව(වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.

(මෙම දැන්වීම් පදනම් කරගෙන විවිධ ආයතන විසින් සාවද්‍ය ලෙස සකස්කර ඉදිරිපත් කරනු ලබන දැන්වීම්වල සඳහන් කරුණු සහ අයදුම්පත්‍ර කෙරෙහි කිසිදු වගකීමක් දරනු නොලැබේ.)

ආදර්ශ අයැදුම්පත්‍රය

*වයඹ පළාත් දේශීය වෛද්‍ය, ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ ක්‍රීඩා නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2015*

ඉල්ලුම් කරනු ලබන තනතුර : [ ]

ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණිය - 1
අභ්‍යාසලාභී තනතුර - 2

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2, දෙමළ - 3, ඉංග්‍රීසි -4 [ ]

01 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA A. B.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)

1.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.7 දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

1.6 ඔබ දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවෙක් නම්.-
තනතුරු නාමය :————.
පත්වීම් දිනය :————.

02. 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1, පුරුෂ - 0) ☐
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.2 විවාහක/අවිවාහක බව :
(අවිවාහක - 1, විවාහක -2) ☐

2.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

03. උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2015.07.06 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

4.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

*පළමුවර*

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

අ.පො.ස. (උසස් පෙළ) විභාගය :

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |

4.2 *වෘත්තීය සුදුසුකම්.-*.............................................................................................
.............................................................................................................................

(අයැදුම්පත්‍රය සමඟ වෙනත් කිසිදු සහතිකයක් ඉදිරිපත් නොකළ යුතුය)

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :————.
දිනය :————.
ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

06. *අයැදුම්කරුගේ සහතිකය :*

...................................................................... වන මා විසින් මෙම අයැදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක.................... හා .................... වැනි දින දරන ලදු පත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නිතීරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

..................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයැදුම්පත ඉදිරිපත් කරන........................................................ මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය.......................දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ලදුපත මෙහි අලවා ඇති බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :————.
අත්සන :————.
තනතුර හා නිල මුද්‍රාව :————.

(මෙම සහතිකය රජයේ විද්‍යාලක විදුහල්පතිවරයෙකු/සාමදාන විනිශ්වයකාරවරයෙකු/දිවුරුම් කොමසාරිස්වරයෙකු/නීතිඥයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිළධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.)

රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයැදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය. (අනවශ්‍ය වචන කපා හරින්න)
..........................................................................................මයා/මිය/මෙනවිය දැනට ........................................................අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................ වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිය/නොහැකි ය.

......................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.

06-193

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ජේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ජේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ජේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ජේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ජේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ජේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ජේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2015**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | 2015.06.05 | සිකුරාදා | 2015.05.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.12 | සිකුරාදා | 2015.05.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.19 | සිකුරාදා | 2015.06.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.06.26 | සිකුරාදා | 2015.06.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2015.08.07 | සිකුරාදා | 2015.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.14 | සිකුරාදා | 2015.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.21 | සිකුරාදා | 2015.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.28 | සිකුරාදා | 2015.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
*රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.